T-01

# ථෙරවාදී බුදු සමයෙහි ඉගැන්වෙන සත්‍ය සංකල්පය පිළිබඳ අධ්‍යයනයක්

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
(කැලණිය විශ්වවිද්‍යාලය)
වෙත ඉදිරිපත් කැරෙන දර්ශනපති
උපාධි පරීක්ෂණ නිබන්ධනය

එච්. එම්. මොරටුවගම

# ථෙරවාදී බුදු සමයෙහි ඉගැන්වෙන සත්‍ය සංකල්පය පිළිබඳ අධ්‍යයනයක්

## ප්‍රවේශය

ගෞතම බුදුරජාණන් වහන්සේ අනුත්පාදිත මාර්ගයේ උත්පාදකයාණෝ ය; අසංජාත මාගීයේ ජනේතෘ වරයාණෝ ය; අනක්ඛාත මාර්ගයේ වක්තෘවරයාණෝ ය. එතුමෝ නව මඟක් ලොවට හෙළි කළහ. උන් වහන්සේ අනුව යමින් ලොව කවර කෙනෙකුට වුව එතුමන් පසක් කළ විමුක්ති සුවය අත්දැකිය හැකි ය; වෙත ළඟා කර ගත හැකි ය. ඒ නිසා බෞද්ධ දර්ශනය ශුද්ධ දාර්ශනිකයාගේ කාර්යයෙන් බැහැර යෙ යි; ශුද්ධ තාර්කිකයාගේ කාර්යයෙන් බැහැර යෙ යි. සෙසු සමය සම්ප්‍රදායයන්ගෙන් බැහැර යෙ යි.

බුදුන් වහන්සේ සිය ශ්‍රාවක ජනතාව අමතන්නේ 'එව, බලව' යනුවෙනි. එ බැවින් බුදු දහම ඒහි එස්සික ය.

බුදුන් වදාළ යථාභූත ඥාන දර්ශනය සාක්ෂාත් කර ගැනීමට බ්‍රහ්මචරිය වාසය අත්‍යවශ්‍ය ය. ඒ නිසා බුදු දහම ආචාර විද්‍යාත්මක පදනමක පිහිටා මනෝ විද්‍යාත්මක විශ්ලේෂණය ගරු කරමින් දර්ශනය ඉදිරිපත් කරයි. සත්‍යය පිළිබඳ උගන් වන්නේ ද ඒ පදනමෙහි පිහිටා සිට ය.

තිදොරින් එකක් වූ වචනයෙන් සංවරත්වය ඇති කර ගන්නා ශ්‍රාවකයා සාවද්‍යයෙන් වැළකී නිරවද්‍ය වාග් ව්‍යවහාරය ප්‍රගුණ කරයි; සබවස සුරකියි.

"මුසාවාදං පහාය මුසාවාද පටිවිරතෝ හෝති සච්චවාදී සච්චසන්ධෝ ථේතෝ පච්චයිකෝ අභිසංවාදකෝ" ලෝකස්ස. පිසුණං වාචං පහාය පිසුණා වාචා පටිවිරතෝ හෝති, ඉතෝ සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමේසං භේදාය, අමුත්‍ර වා සුත්වා න ඉමේසං අක්ඛාතා අමූසං භේදාය, ඉති භින්නානං වා සන්ධාතා; සහිතානං වා අනුප්පදාතා, සමග්ගාරාමෝ සමග්ගරතෝ සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හෝති, ඵරුසං වාචං පහාය ඵරුසා වාචා පටිවිරතෝ හෝති යා සා වාචා නේලා කණ්ණසුඛා පේමනීයා හදයංගමා පෝරී බහුජන කන්තා බහුජනමනාපා තථාරූපි වාචං භාසිතා හෝති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතෝ හෝති, කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචිං භාසිතා කාලෙන සාපදේස පරියන්තවතිං අත්ථසංහිතා"

(ම. III. 226)

උපයෝගිතා ගුණයෙන් අනූන බුදු දහම සදාචාරාත්මක ඉගැන්වීම් ප්‍රතික්ෂේප කළ සමය සම්ප්‍රදායයන් ඍජු ව පිළිකෙව් කළ අයුරු මජ්ඣිම නිකායේ සන්දක සූත්‍රයෙහි වාර්තා කර ඇත. එහි ලා මිථ්‍යා ආගම් හතරක් ද නොමනා ආගම් හතරක් ද දැක්වෙයි. බුදුරදුන්ගේ අග්‍ර උපස්ථායක ආනන්ද තෙරණුවන් විසින් මේ කරුණ පහදා දී ඇත.

(අ) I. මිනිසා භෞතික මූලධර්මවලින් නිර්මිත ය; පරලොවක් නැතැ යි ඉගැන් වූ ආගම්;

II. සදාචාරාත්මක සාරධර්ම ප්‍රතික්ෂේප කළ ආගම්;

III. හේතු ඵලවාදය ප්‍රතික්ෂේප කළ මිනිසාගේ ආරක්ෂාව හා අභය ප්‍රාතිහාර්ය මාර්ගයෙන් සිදු වේ යයි අදහත ආගම්;

IV. නියතිවාදී ආගම්

නියත වශයෙන් ම මිථ්‍යා නොවන එහෙත් නොමනා ලෙස හැඳින්විය යුතු ආගම් හතරකි.

(ආ) I. සිය ශාස්තෘවරයාට සර්වඥතාව පවරන ආගම්;

II. අනුශ්‍රැතිය කොට ගත් ආගම්;

III. ශුද්ධ තර්ක න්‍යාය මත ගොඩනැගුණු ආගම්;

IV. අමරාවික්ෂේප වාදී ආගම්

මේ සියලු සමය සම්ප්‍රදායයන් ප්‍රතික්ෂේප කළ බුදුන් වහන්සේ බ්‍රහ්මචරිය වාසයෙහි යෙදී එහි කෙළවර පරම සත්‍යය පසක් කර ගන්නා ලෙස සිය ශ්‍රාවකයනට වදාළහ. එ බැවින් බුදුරදුන් වෙත ආකාරවතී සද්ධාව ජනිත කර ගන්නා ශ්‍රාවකයා එතුමන් දැක්වූ මඟෙහි ගමන් කොට පරමාර්ථ සත්‍යය ප්‍රත්‍යක්ෂ කොට ගනි යි; බුදුන් වදාළ අද්වය සත්‍යය පසක් කර ගනි යි. බෞද්ධයාගේ බ්‍රහ්ම චර්ය වාසයෙහි අග්‍ර ඵලය එය ය.